**ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය - 2023**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සාගර විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සාගර විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සාගර විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සාගර විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සාගර විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාග්ධන ප්‍රදාන හා පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ රු.53,263,671ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හුවමාරු නොවන ගනුදෙනුවලින් ලද ආදායම් ලෙස ගලපා තිබියදී හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ නැවතත් අදාල ප්‍රාග්ධන ප්‍රදාන හා පරිත්‍යාග යටතේ ගලපා, සමුච්චිත අතිරික්තයෙන් එම අගය ඉවත්කර තිබීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හිමිකම නිවැරදිව දක්වා නොතිබුණි. | 2024 වර්ෂයේ අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමේ දී නිවැරදි කිරීමට උපදෙස් ලබා දෙන ලද බව | මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන ප්‍රදාන හා පරිත්‍යාග ලැබීම් නිවැරදිව ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල ගෙවිය යුතු වියදම් රු.2,088,390 ක් ගිණුම් ගත කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි. | දීප ව්‍යාප්තව විශ්වවිද්‍යාලයේ මධ්‍යස්ථාන පිහිටීම නිසා, තොරතුරු ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීමේ දී මෙම ගැටළුව සිදුවී ඇති බව. | වර්ෂයට අදාල ගෙවිය යුතු වියදම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.23,278,137 ක් වූ වියදම් නොකල ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂය ස්කන්ධය යටතේ දැක්වීම වෙනුවට ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 11 ට අනුව භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් උපයෝජන කරන ලද ප්‍රමාණය මූල්‍ය කාර්යසාධන වාර්තාවේ හුවමාරු නොවන ගනුදෙනු යටතේ සටහන් කර උපයෝජනය නොකළ ප්‍රමාණය ජංගම වගකීමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇති බව. | ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් වියදම් නොකල ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂය ස්කන්ධය යටතේ දැක්වීම කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාග්ධන ලැබීම් රු.66,156,298 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ එම අගය රු.46,460,299 ක් ලෙස දක්වා තිබුණි. | ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම් රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත අංක 11 ප්‍රකාරව සිදුකර ඇති අතර ඒ අනුව උපයෝජනය කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රාග්ධන ලැබීම් ලෙසත් වියදම් නොකළ ප්‍රතිපාදන ප්‍රමාණය ජංගම වගකීම් වැඩිවීමක් ලෙස සලකා කාරක ප්‍රාග්ධනය වැඩිවීමක් ලෙස දක්වා ඇති බව. | ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ නිවැරදිව දැක්විය යුතුය. |
| (ඉ) | 2022 වර්ෂයට අදාල රු.361,956 ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස සටහන් කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | වියදම් අධීක්ෂණය කිරීම සඳහා අභ්‍යන්තර ක්‍රමවේදයක් හඳුන්වා දී තිබුණද විශ්වවිද්‍යාලයේ මධ්‍යස්ථාන දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටා තිබීම, කාර්යමණ්ඩලය ප්‍රමාණාත්මකව නොමැතිවීම යන කරුණු හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී තිබෙන බව හා මෙම තත්ත්වය වැලැක්වීමට ඉදිරියේදී කටයුතු කරන බව. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනා ගෙන ගැලපීම් සිදු කළ යුතුය. |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට පාඨමාලා 5 කට අදාලව ලැබිය යුතු පාඨමාලා ගාස්තුව රු.965,005 ක් වුවද උපලේඛන අනුව එම ශේෂය රු.1,286,158 ක් වූයෙන්, රු.321,153 ක නොසැසඳීමක් පැවතුණි. | නිවැරදි කර තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර ඇති බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ආදායම් හා ඊට අදාල උපලේඛන සැසඳී තිබිය යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගෙවිය යුතු ගිණුම් යටතේ හඳුනා නොගත් ආදායම් ලෙස දක්වා තිබූ රු.859,430 කට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මේ වන විට හඳුනාගෙන 2024 අවසන් ගිණුම් තුළින් නිවැරදි කර ඇති අතර ඉතිරි මුදල් ද ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරන බව | විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124(2) | ආදායම් උත්පාදන ඒකකයක් ලෙස ක්‍රියාත්මක දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය පිහිටුවීම සම්බන්ධයෙන් හා කාර්ය මණ්ඩල දිමනා ගෙවීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ඉල්ලා ලිපියක් මේ වන විටත් යොමු කර ඇති බව. | ආදායම් උත්පාදන ඒකකයක් ලෙස දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය පිහිටුවීම හා කාර්ය මණ්ඩල වෙත දිමනා ගෙවීම් සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| i. | මුදල් රෙගුලාසි 371(2) (ආ) | විධිමත් අනුමැතියකින් තොරව උපරිම අත්තිකාරම් සීමාව ඉක්මවා අවස්ථා 13 ක දී රු.106,000 සිට රු.674,800 දක්වා පරාසයක අත්තිකාරම් ලබා දී තිබුණි. | උද්ධමනකාරී තත්ත්වය යටතේ පිරිවැය ඉහල යෑම හේතුවෙන් හා සේවා ලබාගැනීමට ප්‍රථම මුදල් ගෙවිය යුතු වීම වැනි ප්‍රායෝගික හේතුන් මත අදාල අත්තිකාරම් නිදහස් කර ඇති බව. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| ii. | මුදල් රෙගුලාසි 371(5) | සමාලෝචිත වර්ෂයේ අවස්ථා 25 ක දී ලබා දී තිබූ එකතුව රු.1,893,476 ක අත්තිකාරම් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පියවීමට කටයුතුකර නොතිබුණි. | මේ වන විට රු.1,166,091 ක් පියවා අවසන් අතර නොපියවූ අත්තිකාරම් ලාභීන් වෙත ඒවා පියවන ලෙස දන්වා යවා ඇති බව. | අදාල කාර්යය නිම වූ වහාම අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. |
| iii | මුදල් රෙගුලාසි 756 (6) | 2019 වර්ෂයේ සිට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදු කර නොතිබුණි. | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් වෙමින් පවතින අතර වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.3.1 හා 5.5.1 වගන්ති | මට්ටක්කුලිය, ත්‍රිකුණාමලය සහ තංගල්ල රජයේ නිවාසවල පදිංචිව සිටි නිලධාරීන් 07 දෙනෙකුගෙන් 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ මැයි දක්වා අය විය යුතු එකතුව රු.1,808,783 ක් වූ නිවාස කුලී අයකිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ගොඩනැඟිලි පදිංචිය සඳහා වෙන්කරනු ලබන නිවාස ලෙස හඳුනාගෙන නොමැති බැවින් කුලී මුදල් අය කිරීමට නොහැකි බව. | රජයේ නිවාසවල පදිංචිව සිටි නිලධාරීන් අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 5(1) වගන්තිය | දින 29 ත් දින 144 ත් අතර කාල ප්‍රමාදයකින් පසු සේවකයින් 05 දෙනෙකුට රු.4,744,924 ක පාරිතෝෂික ගෙවා තිබුණි. | ඉදිරියේදී ප්‍රමාදයන් වලක්වා ගනිමින් හා අරමුදල් කළමනාකරණය කර ගනිමින් නියමිත කාලය තුළ පාරිතෝෂික මුදල් ගෙවීමට කටයුතු කරන බව. | පාරිතෝෂික මුදල් කාල ප්‍රමාදයකින් තොරව ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/ 19/2023 දරන භාණ්ඩාගාර ලේකම් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද චක්‍රලේඛ ලිපියේ 5 වන ඡේදය. | බැඳුම්කර කඩකරන ලද ආචාර්යවරු දෙදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ අයකර ගෙන තිබූ රු.2,876,769 ක මුදල භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 805 අනුව මුදල් රඳවාගෙන ඇති අතර මෙම චක්‍රලේඛය විශ්වවිද්‍යාලයට අදාල වන පරිදි පාලක මණ්ඩල අනුමැතිය ඉදිරියේදී ලබා ගැනීමට නියමිත බව. | භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛ ලිපියට අනුව අදාල මුදල් භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 66 වගන්තිය | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අදාල කර නොගත යුතු බව දක්වා තිබුණද, විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන අංශ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති ජාතික විශ්වවිද්‍යාල සඳහා අනුමත තනතුරු හා වැටුප් පරිමාණයන් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරවාගෙන තිබුණි. එසේම යෝග්‍යතා පරීක්ෂණ සඳහා ගෙවීම් කිරීම, දුරස්ථ අධ්‍යාපන ඒකකය පිහිටුවීම හා බාහිර දේශක දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ පදනම් කරගෙන තිබුණි. | විශ්වවිද්‍යාලයක් පවත්වාගෙන යෑමේදී අවශ්‍ය වන නියමාවලීන් , රීතීන්, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ පාලන සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගනු ලබන අතර මේ සඳහා ද පාලන සභාවේ අනුමැතිය ලබා ගෙන ඇති බව. | ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී අමාත්‍යාංශය මගින් විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය මධ්‍යස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ලබා දෙන ලද ප්‍රාග්ධන ප්‍රදාන රු.3,019,030 ක් අදාල අරමුණ සඳහා යොදා නොගෙන නිසි අනුමැතියකින් තොරව ස්ථාවර තැන්පතු ගිණුමක ආයෝජනය කර තිබුණි. | මෙම මුදල ගොඩනැගිලි ඉදිකිරීමේ රඳවා ගැනීම් මුදල් වන අතර රඳවා ගැනීම් නිදහස් කරන තෙක් ආදායමක් ලැබෙන ප්‍රභවයක ආයෝජනය කර ඇති බව. | අමාත්‍යාංශය විසින් ලබා දෙන ලද ප්‍රාග්ධන ප්‍රදාන අදාල අරමුණ සඳහා යොදා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,733,753 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.44,713,970 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.48,447,723 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ පුනරාවර්තන ප්‍රදාන ඉහල යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෘත්තීය පුහුණුවේ යෙදෙන ආර්ථික දුෂ්කරතා ඇති සිසුන් සඳහා අමාත්‍යාංශය විසින් ලබා දෙනු ලබන නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර වැඩසටහන මගින් 2023 ජූනි මාසයේදී සිසුන් 418 දෙනෙක් සඳහා රු.6,632,000 ක් ලබා දී තිබුණ අතර ඉන් සිසුන් 178 දෙනෙකුට රු.623,000 ක් පමණක් ගෙවා තිබුණි. ඉතිරි වූ රු.6,009,000 ක මුදල අදාල අරමුණ සඳහා යොදා නොගෙන ජංගම ගිණුමකට බැර කර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම නිෂ්කාර්යව පැවතුණි. | ගෙවීම් ලාභීන් වෙත ඉතිරි මුදල් කඩිනමින් ගෙවීම් කිරීමටත් එසේත් නොමැතිනම් අතිරික්ත අරමුදල් නැවත රේඛීය අමාත්‍යාංශය වෙත අරමුදල් යොමුකිරීමට උපදෙස් ලබා දී ඇති බව. | නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර වැඩසටහනේ මුදල් අදාල අරමුණ සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |